# පිස්කල් විකිණීම්

## පිස්කල් වෙන්දේසියේ විකිණීම

මහනුවර දිසා අධිකරණයේ දී ය

1994 අංක 09 දරන පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව ණය ආපසු අයකර ගැනීම සඳහා කරනු ලබන ඉල්ලීමක් සම්බන්ධ කාරණාවක දී ය.

| | | |
|---|---|---|
| නඩු අංකය | : | DDR 00049/17 |
| ඇස්කීසි අංකය | : | |
| කාර්යය පටිපාටිය | : | ලඝු |
| ස්වභාවය | : | ණය අයකර ගැනීම |
| වටිනාකම | : | රු. 3,594,561.00 |
| ක්‍රියා පටිපාටිය | : | 1994 අංක 09 දරන පනතින් සංශෝධිත 1990 අංක 02 දරන ණය ආපසු අයකර ගැනීම (විශේෂ විධිවිධාන) පනතේ ක්‍රියා පටිපාටිය අනුව |

සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්,
අංක 187, කටුගස්තොට පාර,
මහනුවර.

*.................පැමිණිලිකාර සමාගම.*

*එදිරිව*

01. සරවනමුත්තු ෂන්මුගරාජන්,
113/19, පේරාදෙණිය පාර,
සමඟි මාවත, පේරාදෙණිය.

*...........................විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2018 ක් වූ මැයි මස 31 වන දින දෙන ලද තීන්දුව ප්‍රකාර එකී නඩුවේ 01 වන විත්තිකරුගෙන් අයවීමට ඇති රුපියල් තිස් පන් ලක්ෂ අනූ හතර දහස් පන්සිය හැට එක (රු. 3,594,561.00) ක මුදල හා එම මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම වන තෙක් නීති පොළිය ද නඩු ගාස්තු හා ඇස්කීසි ගාස්තු අයකර ගැනීම සඳහා වර්ෂ 2019 ක් වූ මැයි මස 07 වන දින මා විසින් තහනමට ගන්නා ලද එකී නඩුවේ 01 වන විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපලෙහි ඔහුට අයත් සියලුම අයිතිවාසිකම් හා හිමිකම් වර්ෂ 2019 ක් වූ ජූලි මස 30 වන දින පස්වරු 2.30 ට එකී දේපල පිහිටි අම්පිටිය, පල්ලේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පල්ලේගම දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අම්පිටිය පල්ලේගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අම්පිටිය පල්ලේගම පිහිටි හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි දෙකයි හතරයි අටක් (හෙක්. 0.0248) විශාල කඩඉම් සිතියම් අංක 320386 හි කලාප අංක 03 කැබලි අංක : 0136 හි පිහිටි වික්ටෝරියා ගාර්ඩ්න් නමැති ඉඩමට මායිම් උතුරට : කැබලි අංක 135 පාර ද, නැගෙනහිරට : කැබලි අංක 134 ද, දකුණට : කැබලි අංක 156 ද සහ බස්නාහිරට : නිවාසවල සිට ප්‍රධාන පාරට යන ප්‍රාදේශීය සභා මාර්ගය ද යන මායිම් තුළ පිහිටි ඉඩම සහ එහි තුළ පිහිටි ඉඩම ගොඩනැගිලි සහ සෑම සියලු දේත් වේ. (හිමිකම් අංක 00362525298).

පී. කේ. ජී. පුෂ්පලතා,
අතිරේක රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්/සාම විනිසුරු.
දිසා අධිකරණය, මහනුවර.

වර්ෂ 2019 ක් වූ මැයි මස 22 වැනි දින දී ය.

07-29

